**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.01.20

01. සුරංගනී නෙරංජලා මිය
නො. 150/14/ඒ,
තෙලගපාන පාර, වත්තල.

*පැමිණිලි පාර්ශවය*

*එදිරිව*

01. විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

02. ඩී. එස්. එස්. ලියනගේ මිය
නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය, කැළණිය.

03. ඩී. පී. වෛද්‍යසේකර මයා
ශාලාධිපති,
ශාලා අංක 01, මධ්‍යස්ථාන අංක 0412.
ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල

*වගඋත්තර පාර්ශවය*

**පැමිණිලි අංක : HRC/HO/1958/24**

ඉහත පැමිණිලි අංක යටතේ සුරංගනී නෙරංජලා යන අය විසින් විශේෂ අවශ්‍යතා සහිත වයස අවුරුදු 16 වූ ඕෂධ මෙත්මල් රණතුංග යන තම පුත්‍රයා 2023(2024) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉංග්‍රීසි විෂය ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට යාමේදී සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් 2024.05.16 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් ගොනුකර ඇත. තමාගේ දරුවා උපතේ සිට ආබාධිත දරුවෙක් බවත් තම දරුවාගේ සුසුම්නාව තුනටියෙන් පහළ අක්‍රියව උපන් දරුවෙක්


...න කාර්යාලය / ...தான அலுவலகம் / ...ad Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
...ථන / ...ாலைபேசி / ...ephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බවත් ඒ හේතුවෙන් මෙම දරුවාගේ හිසෙහි සැත්කමක් සිදුකර හිසෙහි තිබූ වතුර ඉවත් කිරීමට බටයක් උදරය දක්වා දමා ඇති බවත්, තම දරුවාගේ ඉනෙන් පහළ කොට අක්‍රිය බව වැඩිදුරටත් සඳහන් කර ඇත. වෛද්‍ය උපදෙස් අනුව තම දරුවා සාමාන්‍ය පාසලකට ඇතුළත් කළ හැකි බැවින් වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලට ඇතුළත් කළ බවත්, එම පාසලේ දී දරුවාට කියවීමට සහ ලිවීමට ගුරුවරුන් කොතරම් උත්සාහ කළ ද එය සාර්ථක නොවූ බවත් සඳහන් කර ඇත. එහෙත් දරුවාට විෂය කරුණු හොඳින් මතකයේ තිබෙන බවත් ගුරුවරු අසන ප්‍රශ්න වලට නිවැරදිව පිළිතුරු ලබාදීමේ හැකියාව පවතින බවත් සඳහන් කර ඇත. එබැවින් පාසලේ වාර විභාග වලදී ප්‍රශ්න පත්‍රවලට ගුරුවරු වාචිකව ප්‍රශ්න අසමින් පිළිතුරු ලබාගැනීම සිදු කළ බවත් ප්‍රකාශ කර ඇත. දරුවාට ලිවීමට නොහැකි බැවින් පාසලේ විදුහල්පතිතුමාගේ අවසර සහිතව දරුවා ඉගෙනුම ලබන පන්ති කාමරයේ සිටිමින් තමා විසින් අදාළ සටහන් ලියා ගැනීම සිදුකරන බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තම දරුවා 2023(2024) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු ලෙස අයදුම් කළ බවත් ඒ සඳහා උඩුපිල ප්‍රාථමික විදුහලේ දී විශේෂ අධ්‍යාපන තක්සේරු කමිටුව විසින් බවත් වන ලද පළමු සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වූ බවත් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා 2024.04.10 දින මහර ජනාධිපති විද්‍යාලයේ දී දරුවාගේ පන්තිභාර ගුරුතුමිය සමග සහභාගී වූ බවත් සඳහන් කර ඇත. එම සම්මුඛ පරීක්ෂණයේ දී දරුවාගේ සියලුම වෛද්‍ය වාර්තා, ඉල්ලීම් ලිපිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ බවත් පන්ති භාර ගුරුතුමිය විසින් වාචිකව ද දරුවා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ බවත් සඳහන් කර ඇත. එහිදී තමා මෙන්ම පන්තිභාර ගුරුවරිය ද මෙම දරුවාට කියවීමට හෝ ලිවීමට නොහැකි බවත්, අසන ප්‍රශ්න වලට හොඳින් පිළිතුරු ලබාදිය හැකි බවත් දැනුම්දුන් බවත් අවශ්‍ය ලේඛන සියල්ල එම නිලධාරීන් වෙත භාරදුන් බවත් ප්‍රකාශ කර ඇත.

තම දරුවාගේ විභාග මධ්‍යස්ථානය වූ වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ ශාලා අංක 01, මධ්‍යස්ථාන අංක 0412 හි පවත්වන ලද අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය විභාගයේ දී, පළමු දින තුන තුළ දී දරුවාගේ ප්‍රශ්න පත්‍රය එක් නිරීක්ෂකවරියක් විසින් කියවූ බවත් තවත් නිරීක්ෂකවරියක් විසින් දරුවා වාචිකව ප්‍රකාශ කරනු ලබන පිළිතුර සටහන් කළ බවත් මෙකී ක්‍රියාපටිපාටිය සියල්ල රෙකෝඩරයක් මගින් පටිගත කළ බවත් ප්‍රකාශ කර තිබේ. විභාගය පවත්වන ලද සිව්වන දිනයේ දී එනම් 2024.05.09 දින පැවති ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය පැවති දින කලාප කාර්යාලයෙන් නිරීක්ෂණවරිය වශයෙන් පැමිණි දෙවන වගඋත්තරකරු වන ඩී. එස්. එස්. ලියනගේ මිය (නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ) විසින්, තම දරුවා ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයන ආකාරය නිරීක්ෂණය කර විභාග ශාලාවේ ගුරුවරු සමග සහ තමා සමග ද කතාබහ කර විභාග ශාලා 01 වෙත ගිය බවත් සඳහන් කර ඇත. පසුව තම දරුවා ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු ලබාදී අවසන් කර II කොටසට පිළිතුරු දෙමින් සිටිය දී, එම නිලධාරිනිය නැවත පස්වන වගඋත්තරකරු වන ඩී. පී. වෛද්‍යසේකර මයා (ශාලාධිපති) සමග පැමිණ තම දරුවාට ප්‍රශ්න පත්‍රය කියවන ලෙස ප්‍රකාශ කළ බවත් එවිට තම දරුවා ප්‍රශ්න පත්‍රය කියවීමට නොහැකි බව

ප්‍රකාශ කළ බවත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකොට ප්‍රශ්න පත්‍රය කියවමින් සිටි ගුරුවරුන්ට ප්‍රශ්න පත්‍රය කියවීමට එපා යැයි ප්‍රකාශ කළ බවත් දරුවාට ප්‍රශ්න පත්‍රය කියවා පිළිතුරු ලබාදෙනවා නම් පමණක් පිළිතුරු සටහන් කර ගන්නා ලෙස දන්වමින් එම ස්ථානයෙන් පිටවී ගිය බවත් ප්‍රකාශ කර ඇත. පසුව තමා විසින් එම සිදුවීම සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු වන ඩී. එස්. එස්. ලියනගේ මිය (නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ) වෙතින් විමසූ බවත්, එවිට එම නිලධාරිනිය විසින් ප්‍රශ්න පත්‍රය ගුරුවරයෙකු විසින් කියවන ලෙසට ලිපියෙහි සඳහන් කර නොමැති බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. එහිදී තමා විසින් දරුවාගේ සියලු ලේඛන එම නිලධාරිනිය වෙත ඉදිරිපත් කළ ද එම නිලධාරිනිය විසින් කිසිදු තීරණයක් ලබානොදී විභාග මධ්‍යයස්ථානයෙන් පිටව ගිය බව ප්‍රකාශ කර තිබේ. පසුව තමා විසින් මෙම සිදුවීම දරුවාගේ පන්තිභාර ගුරුවරියට දන්වා සිටි බවත්, එම ගුරුවරිය විසින් පාසලේ විදුහල්පතිතුමාට දන්වා සිටි බවත් විදුහල්පතිතුමාගේ උපදෙස් මත විභාග දෙපාර්තමේන්තුව වෙත විභාගය අවසන් වූ පසු තම දරුවා ද සමග ගිය බව සඳහන් කර ඇත. විභාග දෙපාර්තමේන්තුවට ගිය පසු කොමසාරිස්තුමිය හමුවී පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින සහන ලිපියෙහි සඳහන් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් කිසිවක් කළ නොහැකි බව ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත. පසුව එම ස්ථානයේ සිටි වෙනත් නිලධාරියෙකු විසින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ලබාදෙන ලද පොදු ලිපිය ම තමාට ද ලබාදී ඇති බවත් එය දෙපාර්තමේන්තුවේ වරදක් බවත් සඳහන් කර එය සකස් කර දෙන ලෙස දැන්වූ බවත් ප්‍රකාශ කර ඇත. පැයකට පමණ පසු ලිපියක් සකස් කර තමාට ලබාදුන් බවත් ඊට පසු දින සිට තම දරුවා සුපුරුදු පරිදි නැවත විභාගයට පෙනී සිටි බවත් ප්‍රකාශ කර තිබේ. තම දරුවා මෙම සිදුවීම හේතුවෙන් මානසිකව පීඩාවට පත් වූ බවත් තමාට සිදුවූ අසාධාරණයට සාධාරණයක් ඉටුකරදෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

ඉහත සඳහන් කරන ලද පැමිණිලි තුනම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.05.16 වන දින පැමිණිල්ල විභාගයට ගත් අතර එදින වගඋත්තර පාර්ශවය සහභාගී නොවූ බැවින් 2024.05.17 වන දින නැවත කැඳවන ලදි. එහිදී වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව ඉදිරියේ පහත පරිදි ප්‍රකාශ ලබාදෙන ලදි.

**පළමුවන වගඋත්තරකරු - විභාග කොමසාරිස් ජනරාල් (විභාග දෙපාර්තමේන්තුව)**

2024.05.17 වන දින පැමිණිල්ල විභාග කිරීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි විභාග කොමසාරිස් ජනරාල් එච්. ජේ. එම්. සී. ඒ. ජයසුන්දර මහතා පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට පෙනී සිටීමේදී බ්‍රේල් මාධ්‍ය ඔස්සේ පිළිතුරු ලිවීම සඳහා පහසුකම් සපයා දීම සිදුකරන බවත්, වාචිකව පිළිතුරු ලබාදීම සඳහා ක්‍රමවේද දෙකක් පවතින අතර, එහිදී අන්ධභාවයට පත්වූ දරුවන් සඳහා ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා ගුරුවරයෙක් ලබාදෙන අතර දරුවා බ්‍රේල්

ක්‍රමවේදය ඔස්සේ පිළිතුරු ලිවීම සිදුකරනු ලබන බවත් සඳහන් කර ඇත. තවද විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙසට අදාළ විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත ලිඛිතව දැනුම්දීම් සිදුකරන අතර, එකී ලිපි මෙතෙක් සිංහල මාධ්‍යයෙන් යොමුකරනු ලැබූ බවත්, එහෙත් මේවන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් වාර්තා වී නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේ නමුත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන්නේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට විභාගයට මුහුණදීමේ දී පවතින බාධා ඉවත් කිරීම පමණක් බවත්, මෙම දරුවා සම්බන්ධයෙන් ගැටලුවක් මතුවී තිබේද යන්න විමර්ශනය කර සහනයක් ලබාදීමට අවශ්‍ය පියවර ගත හැකි බව සඳහන් කර ඇත.

විභාග දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය විභාග කොමසාරිස් ජනරාල් ඩී. එන්. එස්. අතුකෝරල මහතා කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට මුහුණදීමේ දී ඔවුන් සඳහා ලබාදිය යුතු පහසුකම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් දැනුම සහ පුහුණුව ලත් නිලධාරීන් පත්කරනු ලබන බව සඳහන් කර ඇත. ඇතැම් දරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ඒමට නොහැකි අවස්ථාවන් වලදී එම දරුවන්ගේ නිවෙස් වලට ගොස් විමර්ශන කර වාර්තා කිරීම සිදුකරනු ලබන බව සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින අවස්ථාවේදී දරුවා සම්බන්ධයෙන් වූ වෛද්‍ය වාර්තා ඇතුළු අනෙකුත් ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව දරුවන්ගේ භාරකරුවන් වෙත පූර්ව දැනුම්දීමක් සිදුකරනු ලබන බව සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දරුවන් සමග මෙන්ම දෙමාපියන් සමග ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාකච්ඡා කරන බවත් එම අවස්ථාවේදී ඉල්ලුම් පත්‍රයක් ලබාදෙන බවත් එය දරුවාගේ භාරකරුවන් විසින් සම්පූර්ණ කළ යුතු බවත් සඳහන් කර ඇත. තවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දරුවාට ලිවීමට, කියවීමට හැකියාව පවතී ද යන්න පරීක්ෂා කරනු ලබන බවත් සඳහන් කර ඇත. මෙම ගැටලු සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විභාග කොමසාරිස් ජනරාලතුමා විසින් සමාලෝචන කමිටුවක් පත් කරනු ලබන බවත්, එම කමිටුව මගින් ශ්‍රී ලංකාව තුළ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් පවත්වන ලද සියලුම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සම්බන්ධයෙන් සොයාබලන බවත් සඳහන් කර ඇත. එමෙන්ම කිසිදු නිලධාරියෙක් හෝ මණ්ඩලයක් තනි තීරණයක් නොගන්නා බවත් මෙම ගැටලුව සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයක් පත් කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**දෙවන වගඋත්තරකරු - ඩී. එස්. එස්. ලියනගේ මිය (නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන කාර්යාලය, කැළණිය)**

ඉහත වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2025.05.22 වන දින පවත්වන ලද විභාගය සඳහා සහභාගිවෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත. 2024.05.09 ව දින අ.පො.ස. (සා.පෙළ) විභාගය පවත්වන ලද වත්තල, ශාන්ත අන්තෝනි ජාතික පාසලේ විභාග අධීක්ෂණ රාජකාරි

කටයුතු තමාට පැවරී තිබූ බවත්, ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් විභාග අධීක්ෂණ කටයුතු සඳහා තමාට බලය පවරන ලද ලිපියක් නිකුත් කර තිබූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තමා වත්තල, ශාන්ත අන්තෝනි ජාතික පාසලේ උදය කාලයේ අධීක්ෂණ කටයුතුවල නිරත වූ බවත්, ශාලා අංක 01 මධ්‍යස්ථාන අංක 0412 හි විශේෂ අවශ්‍යතා සහිත ඕෂධ මෙත්මල් රණතුංග දරුවා විභාගයට පෙනී සිටි බවත් සඳහන් කර ඇත. එම විභාග අපේක්ෂකයා විභාගය ලියන ස්ථානයේ නිරීක්ෂකවරු දෙදෙනෙක් රැඳී සිටි බවත්, තමා මදක් එම ස්ථානයේ නතරවී එම ස්ථානයේ විභාගය පැවැත්වෙන ආකාරය නිරීක්ෂණය කිරීම සිදු කළ බවත් ප්‍රකාශ කර තිබේ. එහිදී එක් නිරීක්ෂකවරයෙක් අපේක්ෂකයාට ප්‍රශ්න පත්‍රය කියවා දෙන අතර අනෙක් නිරීක්ෂකවරයා රෙකෝඩරය භාවිතා කරමින් අපේක්ෂකයා ලබාදෙන පිළිතුර පටිගත කරමින් අපේක්ෂකයා ලබාදෙන පිළිතුරු සටහන් කර ගනිමින් සිටින ආකාරය තමා නිරීක්ෂණය කළ බවත් ප්‍රකාශ කර ඇත. එදින ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය යෙදී තිබුණු අතර ප්‍රශ්න පත්‍රය කියවන ලද නිරීක්ෂකයා විසින් ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රය කියවා සිංහලෙන් එය පැහැදිලි කර දෙන ආකාරය තමා දුටු බව ප්‍රකාශ කර ඇත. එසේ සිදු කළ නොහැකි බැවින් තමා විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් නීල් අතුකෝරළ මහතාට දුරකථන ඇමතුමක් ලබාදී එම සිදුවීම පැහැදිලි කර ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් ලබාගත් බවත් ප්‍රකාශ කර තිබේ. එහිදී තමාට ලැබුණු උපදෙස වූයේ, විශේෂ අවශ්‍යතා සහිත විභාග අපේක්ෂකයන්ට පහසුකම් සැපයිය යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් පත්‍රිකාවක් ශාලාධිපති වෙත ලබාදී ඇති බවත්, එක් එක් අපේක්ෂකයාට වෙන් වෙන් වශයෙන් උපදෙස් පත්‍රිකා නිකුත් කරන බවත් ය. ඒ අනුව තමා ශාලාධිපති ලෙස රාජකාරි කටයුතු කළ ඩී. පී. වෛද්‍යසේකර මහතා (පස්වන වගඋත්තරකරු) හමුවී මෙම විභාග අපේක්ෂකයා සඳහා නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකාව පරීක්ෂා කළ බව සඳහන් කර ඇත. එකී උපදෙස් පත්‍රිකාවෙහි නිරීක්ෂකවරයාට ප්‍රශ්න පත්‍රිය කියවන ලෙස හෝ සිංහලනේ පැහැදිලි කරන ලෙස සඳහන් කර නොතිබුණු බව ප්‍රකාශ කර තිබේ. පසුව තමා විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් නීල් අතුකෝරළ මහතා වෙත නැවත ඇමතුමක් ලබාදී ඒ පිළිබඳව දැනුවත් කළ බවත්, එම නිලධාරියා එම අවස්ථාවේදී තමාගේ දුරකථනයෙන්ම ශාලාධිපති අමතා උපදෙස් පත්‍රිකාවේ දක්වා ඇති පරිදි කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් බවත් සඳහන් කර ඇත. පසුව තමා ශාලාධිපති ළඟ තිබෙන ජර්නලයෙහි විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති උපදෙස් පරිදි කටයුතු කරන ලෙසට සටහන් යෙදූ බවත් ප්‍රකාශ කර තිබේ. තවද විභාග අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ රැස්වීම් වලදී විශේෂ අවශ්‍යතා සහිත විභාග අපේක්ෂකයන් සඳහා නිකුත් කරන ලද උපදසේ පත්‍රිකාවේ ලබාදී ඇති සහන පමණක් එම අපේක්ෂකයන්ට ලබාදීමට කටයුතු කරන ලෙසට දැනුවත් කර ඇති බව ප්‍රකාශ කර ඇත. තමා විභාග ශාලාවන යන අවස්ථාවේදී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රියේ පළමු කොටසට විභාග අපේක්ෂකයා පිළිතුරු දෙමින් සිටි අවස්ථාවේදී වන අතර, මෙම සිදුවීම වන අතරතුර ඉංග්‍රීසි භාෂාව දෙවන ප්‍රශ්න පත්‍රිය ද ලබාදී ඒ සඳහා පිළිතුරු ලිවීම ආරම්භ කර තිබුණු බව ප්‍රකාශ කර ඇත. තමා අවශ්‍ය උපදෙස් ලබාදී වෙනත් ශාලාවක් වෙත ගිය බවත් මෙම දරුවාගේ මව පැමිණ තමා හමුවී දරුවාට ප්‍රශ්න පත්‍රය කියවීමට නොහැකි

බැවින් කිසිවෙකු විසින් එය කියවිය යුතු බව ප්‍රකාශ කළ බවත්, එහිදී තමා විසින් එම මවට, විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ උපදෙස් පත්‍රිකාව නැවත නිවැරදි කරගෙන පැමිණෙන ලෙස උපදෙස් ලබාදුන් බව ප්‍රකාශ කර තිබේ. විශේෂ අවශ්‍යතා සහිත විභාග අපේක්ෂකයන් විභාගයට මුහුණදීමේදී විභාග දෙපාර්තමේන්තුව මගින් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව විභාග අපේක්ෂකයාට ලබාදිය යුතු සහනය පිළිබඳව උපදෙස් පත්‍රිකාවක් නිකුත් කරනු ලබන බවත්, එය විභාගයට පෙර විදුහල්පති වෙත යොමුකරන අතර, එහි සඳහන් සහන ප්‍රමාණවත් නොවන්නේ නම් අභියාචනා කිරීමේ අවස්ථාව පවතින බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ. එහෙත් මෙම විභාග අපේක්ෂකයා සම්බන්ධයෙන් ලබාදී ඇති උපදෙස් පත්‍රිකාව සම්බන්ධයෙන් දෙමාපියන් එසේ නිවැරදි කිරීමක් සිදුකරගෙන නොමැති බව ද සඳහන් කර තිබේ. තවද තමා මෙහිදී කටයුතු කරනු ලැබුවේ විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ උපදෙස් අනුව බව සඳහන් කර තිබේ. තවද විභාග දෙපාර්තමේන්තුව විසින් මෙම සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකළ අතර, 2024.10.29 දිනැති ලිපිය මගින් වසර දෙකක් සඳහා විභාග කටයුතු අධීක්ෂණ කිරීම තහනම් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් තමන් 2024.11.03 දැනිතැව විභාග දෙපාර්තමේන්තුවට අභියාචනයක් යොමුකර ඇති නමුත්, ඒ සඳහා පිළිතුරු ලැබී නොමැති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**තෙවන වගඋත්තරකරු - ඩී. පී. වෛද්‍යසේකර මයා (ශාලාධිපති)**

ඉහත වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී 2025.05.08 වන දින පවත්වන ලද විභාගය සඳහා සහභාගිවෙමින් පහත සඳහන් ප්‍රකාශය ලබාදී ඇත. 2024.05.06 දින සිට පවත්වන ලද 2023/2024 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී තමා ශාලාධිපති ලෙස වත්තල, ශාන්ත අන්තෝනි ජාතික පාසලේ ශාලා අංක 01 මධ්‍යස්ථාන අංක 0412 හි ශාලාධිපති ලෙස කටයුතු කළ බවත් සඳහන් කර ඇත. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වීමට පෙර දින එනම් 2024.05.05 දින විභාග සම්බන්ධීකරණ මධ්‍යස්ථානයෙන් තමාට විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු සිටින බවට ලිපියක් සහිත උපදෙස් පත්‍රිකාවක් සහ රෙකෝඩර් යන්ත්‍රයක් ලැබුණු නමුත්, එම දරුවා පිළිබඳව කිසිදු විශේෂ තොරතුරක් තමාට ලබාදී හෝ දැනුවත්කර නොතිබුණු බව ප්‍රකාශ කර ඇත. එබැවින් තමා වත්තා රෝමානු කතෝලික දෙමළ විද්‍යාලයේ විභාග සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ නිලධාරී ඒ. ජේ. ආර්. ගොඩ්වින් මහතා අමතා ලිපියෙහි සඳහන් විශේෂ අවශ්‍යතා සහිත දරුවා පිළිබඳව විමසූ බව සඳන් කර ඇත. එම නිලධාරියා ද මෙම දරුවා පිළිබඳව දැනුවත්ව නොසිටි බැවින් විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් නීල් අතුකෝරාල මහතාගෙන් විමසීමක් සිදුකරන මෙන් තමාට උපදෙස් ලබාදුන් බව සඳහන් කර ඇත. ඒ අනුව එකී උපදෙස් පරිදි තමා විසින් නියෝජ්‍ය විභාග කොමසාරිස්තුමාගේ පුද්ගලික දුරකථනයට ඇමතුම් වාර කිහිපයක්ම ලබාගත්ත ද එතුමා සම්බන්ධකර ගැනීමට නොහැකි වූ බැවින්, මෙම දරුවා ඉගෙන ගනු ලබන වත්තල ශාන්ත අන්තෝනි පාසලේ නියෝජ්‍ය විදුහල්පතිනි ශාමලී සුරවීර මිය අමතා මෙම දරුවා පිළිබඳ විස්තර තබාගත් බවත්

ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම පැමිණිල්ලෙහි අගතියටපත් පාර්ශවය වන ඕෂධ මෙත්මල් රණතුංග දරුවා පිළිබඳව තමාට පාසල මාර්ගයෙන් දැනගැනීමට හැකිවූ පසු එම දරුවාට ප්‍රවේශවීමට පහසු විභාග මධ්‍යස්ථානයට ප්‍රවේශවන ස්ථානයේම පළමු පන්ති කාමරය සූදානම් කිරීම තමා විසින් සිදුකළ බව ප්‍රකාශ කර තිබේ. තවද තමාට ලබාදී තිබූ රෙකෝඩරය ක්‍රියාත්මක කරන ආකාරය ද නිවැරදිව අධ්‍යයනය කළ බව සඳහන් කර ඇත. විභාගය පවත්වන දිනට මෙම දරුවා සඳහා නිරීක්ෂකවරු දෙදෙනෙක් යොමුකිරීමට උපදෙස් ලබාදී තිබූ බවත්, එහිදී එක් නිරීක්ෂකවරයෙක් ප්‍රශ්න පත්‍රය කියවීමට ද, අනෙක් නිරීක්ෂකවරයා රෙකෝඩරය මගින් දරුවා ලබාදෙන පිළිතුරු පටිගත කිරීමට සහ පිළිතුරු ලිවීමට ද, දරුවාට විනාඩි 15 ක අමතර වේලාවක් ලබාදිය යුතු බවට ද උපදෙස් පත්‍රිකාවේ සඳහන්ව තිබූ බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම දරුවාගේ මවට දරුවා පෙනෙන දුරින් සිටීමට අවස්ථාව ලබාදෙන ලෙස ද උපදෙස් ලබාදී තිබූ බව සඳහන් කර ඇත. 2024.05.06 දින එනම් විභාගය ආරම්භ කළ දින දරුවාගේ මව විසින් දරුවා ශිෂ්‍යත්ව විභාගයට මුහුණදුන් අවස්ථාවේදී ලබාදී තිබූ උපදෙස් පත්‍රිකාවේ පිටපත් සහ ශාන්ත අන්තෝනි විද්‍යාලයේ විදුහල්පති විසින් දරුවා සම්බන්ධයෙන් ලබාදී තිබූ ලිපිය තමා වෙත ඉදිරිපත් කළ බවත් එකී ලිපි සහ උපදෙස් පත්‍රිකා සියල්ල සැලකිල්ලට ගනිමින් මෙම දරුවාට අවශ්‍ය පහසුකම් තමා විසින් මෙම දරුවාට ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. 2024.05.06 දින විභාග මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සඳහා වත්තල කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ කුමාරසිංහ මහතා පැමිණි බවත්, එම නිලධාරියා විසින් මෙම දරුවා විභාගයට මුහුණදෙන ආකාරය සහ අනෙකුත් දරුවන් විභාගයට මුහුණදෙන ආකාරය අධීක්ෂණය කර විභාග දෙපාර්තමේන්තුවේ වෙනත් අධීක්ෂකවරුන්ගේ සටහන් යෙදීම සඳහා ශාලාධිපතිවරුන් වෙත ලබාදෙන ලද විභාග ජර්නලයේ ක්‍රමවත්ව විභාග කටයුතු පැවැත්වෙන බවට නිරීක්ෂණ සටහන් යොදා පිටත්ව ගිය බව සඳහන් කර ඇත. 2024.05.07 දින නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දර්ශනී ගීතිකා මහත්මිය විභාග මධ්‍යස්ථාන අධීක්ෂණ කටයුතු සඳහා පැමිණි බවත් එතුමිය විසින් ද පෙර පරිදිම මෙම දරුවා සහ අනෙකුත් දරුවන් ක්‍රමවත්ව විභාගයට මුහුණදෙන ආකාරය අධීක්ෂණය කර ඒ පිළිබඳව ඉහත දක්වන ලද ජර්නලයෙහි සටහන් යොදා ගිය බවත් සඳහන් කර තිබේ. 2024.05.08 දින විභාග මධ්‍යස්ථාන අධීක්ෂණය සඳහා කැළණිය කොට්ඨාශ අධ්‍යපන අධ්‍යක්ෂකතුමිය පැමිණ පෙර පරිදිම සටහන් යොදා ගිය බව සඳහන් කර ඇත. ඒ අනුව ඉහත දින තුනේදීම පැමිණි අධීක්ෂකවරුන් මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවා විභාගයට මුහුණදෙන ආකාරය නිරීක්ෂණය කළ බව සඳහන් කර ඇත. 2024.05.09 දින එනම් මෙම පැමිණිල්ලෙහි සඳහන් ගැටලුව උද්ගත වූ දින ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයේ පළමු කොටස ලියා අවසන්වී තිබූ බවත්, ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයේ දෙවන කොටස දරුවන්ට ලබාදී ඊට පිළිතුරු ලියමින් සිටින අවස්ථාවේදී විභාග ශාලා අධීක්ෂණය සඳහා මෙම පැමිණිල්ලෙහි දෙවන වගඋත්තරකරු වන කැළණිය අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යාක්ෂ (පාලන) ඩී.ඩී.එස්. ලියනගේ මිය පැමිණි බවත්, එම නිලධාරිය තමා හමුවීමට පෙර මෙම විශේෂ අවශ්‍යාතා සහිත දරුවා විභාගයට මුහුණදෙන ආකාරය නිරීක්ෂණය කර තමා වෙත පැමිණ තමාගෙන් එම දරුවාට අදාළ උපදෙස් පත්‍රිකාව ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ප්‍රකාශ කර තිබේ. අදාළ උපදෙස් පත්‍රිකාව එම නිලධාරිනියට ලබාදුන් පසු එය

එතුමිය විසින් කියවා බලා, මෙම දරුවා විභාගයට මුහුණදීම සම්බන්ධයෙන් තමා විසින් අනුගමනය කර ඇති පිළිවෙත වැරදි බවත්, සිදු කළ යුත්තේ දරුවා විසින් තනිවම ප්‍රශ්න පත්‍රය කියවා වාචිකව පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම යැයි ප්‍රකාශ කළ බව වගඋත්තරකරු (ශාලාධිපති) සඳහන් කර ඇත. තවද එසේ සිදුනොකර ප්‍රශ්න පත්‍රය වෙනත් අයෙකු විසින් කියවා ඊට දරුවා ලබාදෙන පිළිතුරු තවත් අයෙකු විසින් සටහන් කිරීම වැරදි සහගත ක්‍රියාවක් බව එම නිලධාරිනිය ප්‍රකාශ කළ බව වගඋත්තරකරු (ශාලාධිපති) සඳහන් කර ඇත. පසුව එම නිලධාරිනිය මෙම දරුවා සිටින ස්ථානයට ගොස් දරුවාට ප්‍රශ්න පත්‍රය තනිව කියවා පිළිතුරු ලබාදෙන ලෙසට ප්‍රශ්න පත්‍රය දරුවා අතට ලබාදුන් බවත්, දරුවා එම අවස්ථාවේදී තමාට ප්‍රශ්න පත්‍රය කියවීමට නොහැකි බව ප්‍රකාශ කළ බවත් වගඋත්තරකරු සඳහන් කර ඇත. දරුවාගේ මව ද ශාලාව ආසන්නයේම සිටි බැවින් මව ද කැඳවා මේ පිළිබඳව විමසීම් කළ බවත්, එම අවස්ථාවේදී දරුවාගේ මව විසින් දරුවා මීට පෙර විභාගයට මුහුණදුන් ආකාරය සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තා ඇතුළු සියලුම ලේඛන එම නිලධාරිනියට ඉදිරිපත් කළ බවත් සඳහන් කර තිබේ. එම නිලධාරිනිය විසින් සියලුම ලේඛන පරික්ෂා කර බලා විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් නීල් අතුකෝරාල මහතාට දුරකථනයෙන් ඇමතූ බවත්, පසුව එම දුරකථනය තමාට ලබාදෙමින් අතුකෝරාල මහතා සමග කතා කරන ලෙස දැන්වූ බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී අතුකෝරාල මහතා දුරකථනයෙන් තමා වෙත චෝදනා කරමින්, මෙම දරුවා සම්බන්ධයෙන් විභාගය පවත්වා ඇති ආකාරය වැරදි බවත්, දින තුනක් පුරා වැරදි ආකාරයෙන් විභාගය පවත්වා ඇති බවත්, දරුවාගේ අනාගතයට තමා විනාශ කර ඇති බවත් ප්‍රකාශ කරමින්, එම ස්ථානයට එතුමා වෙනත් ශාලාධිපති කෙනෙකු පත් කර යොමුකරන බවත්, තමා සතු සියලු ලේඛන සම්බන්ධීකරණ අංශය වෙත භාරදෙන ලෙස දැන්වූ බවත් වගඋත්තරකරු (ශාලාධිපති) ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමා මෙන්ම දරුවාගේ මව විසින් ද දෙවන වගඋත්තරකරු වන ඩී.ඩී.එස්. ලියනගේ මියගෙන් දරුවා දැනට ලියමින් පවතින ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයේ ඉතිරි කොටස දැනට පිළිතුරු ලියන ආකාරයෙන්ම ලිවීමට දරුවාට අවස්ථාව ලබාදෙන මෙන් ඉල්ලීම් කළ බව සඳහන් කර ඇත. තවද තමා එවැනි ඉල්ලීමක් සිදුකරනු ලැබුවේ දරුවා විභාගයකට මුහුණදෙමින් සිටින බැවින් දරුවාගේ මානසිකත්වය පිළිබඳව අවධානය යොමුකළ යුතු බැවින් බව වැඩිදුටත් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී ඩී.ඩී.එස්. ලියනගේ මිය විසින් දරුවා සඳහා නිකුත් කර ඇති උපදෙස් පත්‍රිකාවේ ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා නිරීක්ෂකයෙකු ලබාදෙන ලෙස සඳහන් කර නොමැති බැවින් එසේ ලබාදිය නොහැකි බවත්, විභාග දෙපාර්තමේන්තුව වෙත ගොස් එම කොටස ද ඇතුළත් කරගෙන පැමිණෙන ලෙසත් දැනුම්දෙන ලදි. තවද විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අදාළ විෂය සම්බන්ධ ප්‍රවීණයෙකු පත් කළ යුතු බැවින් ප්‍රශ්න පත්‍රය කියවීමේදී මා විසින් ඒ ඒ දිනවලදී ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා විෂය ප්‍රවීණයෙකු නිරීක්ෂකයෙකු ලෙස පත් කළ බවත්, මෙම ගැටලුව උද්ගත වූ දින පැවති ඉංග්‍රීසි භාෂා විෂය ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා තමා විෂය ප්‍රවීණයෙකු නිරීක්ෂක ලෙස පත් කළ බවත් සඳහන් කර ඇත. එසේ සිදුකරනු ලැබුවේ දරුවාට අසාධාරණයක් සිදුවීම වළක්වා ගැනීම සඳහා බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එහෙත් මෙදින ඩී. ඩී. එස්. ලියනගේ මිය විසින් තමා එසේ විෂය ප්‍රවීණයෙකු පත් කිරීම වැරදි සහගත

ක්‍රියාවක් බවට ප්‍රකාශ කළ අතර, තමා සහ දරුවාගේ මව ලියමින් සිටින ප්‍රශ්න පත්‍රය දරුවාට එතෙක් පැවති සුපුරුදු ආකාරයෙන් ලිවීමට අවස්ථාව ලබාදෙන මෙන් මෙම නිලධාරිනියගෙන් ඉල්ලා සිටිය ද, ඊට අවස්ථාව ලබානොදුන් බැවින් දරුවා ලියමින් සිටි ඉංග්‍රීසි භාෂාව දෙවන කොටස ප්‍රශ්න පත්‍රය කියවීම අතරමග නතර කිරීමට සිදුවූ බවත්, එසේ සිදු කළ බැවින් දරුවාට ප්‍රශ්න පත්‍රය කියවා පිළිතුරු ලිවිය නොහැකි බැවින්, දරුවා ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම ද නතර කරනු ලැබූ බව ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී දරුවාගේ පන්තිභාර ගුරුවරිය ද එම ස්ථානයට පැමිණි බැවින් කාර්යාලීය වශයෙන් නැවත ලිපියක් සකස්කර දරුවාගේ මවට අවශ්‍ය උපදෙස් ලබාදී එම වේලාවේදීම විභාග දෙපාතමේන්තුව වෙත යැවූ බව සඳහන් කර ඇත. මෙම සිදුවීම හේතුවෙන් නියෝජ්‍ය විභාග කොමසාරිස් ජනරාල් නීල් අතුකෝරාල මහතා එම අවස්ථාවේම විභාග ශාලාධිපති රාජකාරී වලින් ඉවත්වී ලිපි ලේඛන භාරදෙන ලෙස තමාට දැනුම්දුන්න ද, එම අවස්ථාවේ දරුවන් සියට වැඩි ප්‍රමාණයක් විභාගයට මුහුණදෙමින් සිටි බැවින්, තමාට එකී වගකීම බැහැර කිරීමට නොහැකි බැවින් ප්‍රශ්න පත්‍ර සියල්ල නිවැරදි වේලාවට එකතුකර ඒවා සීල් තබා අනෙකුත් ලේඛන ද සමග සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට ලබාදී තමා විභාග ශාලාධිපති රාජකාරී කටයුතු වලින් ඉවත් වූ බව ප්‍රකාශ කර ඇත. 2025.05.15 අ.පො.ස. (සාමන්‍ය පෙළ) විභාගය අවසන් වූ දින අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ අධ්‍යපන ඒකකයේ නිලධාරීන් දෙදෙනෙක් විභාගය පැවැත් වූ ශාන්ත අන්තෝනි ජාතික පාසලට පැමිණ පරීක්ෂණයක් සිදු කළ බවත්, එහිදී මෙම දරුවා ද, තමා සහ දරුවාගේ මව ද, 2024.05.09 දින දරුවාගේ විභාග ප්‍රශ්න පත්‍රය කියවීම හා ලිවීම සඳහා නිරීක්ෂක ලෙස යොදා තිබූ ගුරුවරියන් දෙදෙනා ද එම පරීක්ෂණයට සහභාගීවී ප්‍රකාශ ලබාදුන් බව සඳහන් කර ඇත. ඉන් පසු කිසිදු විමර්ශනයකට තමාට කැඳවීමක් නොලැබුණු බවත්, 2025.02.24 දින විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් (විමර්ශන) තුමාගේ අත්සනින් යුතුව තමා මෙම සිදුවීමේදී ශාලාධිපති ලෙස අවස්ථානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අගයමින් සහ තමාට මුහුණදීමට සිදුවූ ගැටලුව හේතුවෙන් රාජකාරී ඉටු කිරීමේදී යම් අපහසුතාවයකට පත් වූයේ නම් කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා ලිපියක් යොමුකර ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ. තවද 2025 වසරේ පැවති අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ශාලාධිපති ලෙස ද තමා රාජකාරී කටයුතුවල යොදවා තිබූ බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

**ප්‍රගතිය විමසීම :-**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාව මගින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර තිබේ. එකී වාර්තාව මගින් විභාග කොමසාරිස් ජනරාල් ප්‍රකාශ කර ඇත්තේ, උක්ත සිදුවීම මුල් කොට ගනිමින් විභාග අපේක්ෂකයින්ට අගතියක් සිදුවී ඇත්නම්, ඒ සඳහා ලබාදිය හැකි සහන නිර්දේශ කිරීම සඳහා තමා කමිටුවක් පත් කරන ලද බවත්, එම කමිටු නිර්දේශ ප්‍රකාරව පහත පරිදි සහන ලබාදීමට කටයුතු කරන බවත් ය. එමෙන්ම 2024.05.09 වන දින

පැවති ඉංග්‍රීසි විෂය II සඳහා පෙනී සිටින අතරතුර ශාලාධිපතිවරයා එතෙක් අනුගමනය කළ විභාග ක්‍රමවේදය වෙනස් කිරීමෙන් විභාග අපේක්ෂකයාට සිදු වූ අපහසුතාවය සලකා ඉංග්‍රීසි භාෂා I පත්‍රය සහ II පත්‍රයට සියුන් ලබාගත් ලකුණුවල සහසම්බන්ධතා ගණනය කර සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේදයක් ඇසුරින් II පත්‍රය සඳහා ලකුණු තීරණය කිරීම සුදුසු බවට කමිටුව තීරණය කර ඇති බව වාර්තාවේ සඳහන් කර ඇත.

තවද ඉහත සිදුවීම හේතුවෙන් අගතියට පත් විභාග අපේක්ෂකයාට දෙනු ලබන සහනයන්ට අමතරව ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා පහත තීරණ ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා ඇත. ඒ අනුව,

- විශේෂ අවශ්‍යතා විභාග අපේක්ෂකයන් සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වඩා විධිමත්ව පැවැත්වීමට කටයුතු කිරීම සහ අදාළ නිර්දේශ ලබාගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.
- විශේෂ අවශ්‍යතා සම්බන්ධව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමේ ලේඛන අපේක්ෂකයින්ගේ භාෂා මාධ්‍ය අනුව යොමු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීම.
- මෙම සිද්ධියට අදාළව නොසැලකිලිමත් ලෙස සහ නීත්‍යානුකුල ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කරන ලද විභාග කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා අවවාද ලිපි නිකුත් කිරීම සහ ඉදිරි විභාග සම්බන්ධව තහනම් පැනවීමට කටයුතු කිරීම.

යනාදී ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව වාර්තාවේ සඳහන් කර තිබේ.

නිරීක්ෂණ :

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට මුහුණ දීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිලධාරීන් විසින් එම දරුවන් සම්බන්ධයෙන් නිවැරදිව අවධානයක් යොමුකර නොමැති බව, මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ඕෂධ මෙත්මල් රණතුංග යන සිසුවා සම්බන්ධයෙන් වූ පැමිණිල්ල විමර්ශනයේදී නිරීක්ෂණය විය.
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඕෂධ මෙත්මල් රණතුංග යන සිසුවා උදෙසා පළමු වරට නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකාව නිරීක්ෂණය කිරීමේදී, එම සිසුවා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින ලද අවස්ථාවේදී විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකාව පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අවධානයක් යොමුකර නොමැති බව පෙනීයයි. ඒ හේතුවෙන් ශිෂ්‍යත්ව විභාග අවස්ථාවේදී සහ පාසලේ වාර විභාග අවස්ථාවලදී නිරීක්ෂකයන් දෙදෙනෙක් සමග විභාගයට මුහුණදීමට (එක් නිරීක්ෂකයෙකු විසින් ප්‍රශ්න පත්‍රය කියවන විට, ඊට ලබාදෙන පිළිතුරු තවත් නිරීක්ෂකයෙකු විසින් සටහන් කර ගැනීමේ ක්‍රමවේදය) පුරුදුව සිටි

විභාග රටාවට ගැළපෙන පරිදි උපදෙස් පත්‍රිකාවක් ලබානොදීම හේතුවෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාග අවස්ථාවේදී එම සිසුවාට මානසික අපහසුතාවයට ලක්වීමට සිදුවී ඇත.

- මෙම සිසුවා විභාගයට මුහුණදුන් වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ ශාලා අංක 01 මධ්‍යස්ථාන අංක 0412 හි ශාලාධිපති ලෙස කටයුතු කළ පස්වන වගඋත්තරකරු වන ඩී. පී. වෛද්‍යසේකර මයා එම සිසුවා සම්බන්ධයෙන් මානුෂීය ආකාරයෙන් සහ සිසුවා එතෙක් විභාග වලට මුහුණදී තිබූ ආකාරයට උචිත ආකාරයෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. එය තවදුරටත්, 2024.05.06, 07 සහ 08 යන දිනයන්හිදී විභාග ශාලා අධීක්ෂණය සඳහා පැමිණි නිලධාරීන් විසින් ශාලාධිපතිවරුන් වෙත ලබාදෙන ලද විභාග ජර්නලයේ ක්‍රමවත්ව විභාග කටයුතු පැවැත්වෙන බවට නිරීක්ෂණ සටහන් යොදා තිබීම තුළින් තහවුරු වේ.
- තවද, තුන්වන වගඋත්තරකරු වන ඩී. පී. වෛද්‍යසේකර මයා වෙත 2025.02.24 දින විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් (විමර්ශන) තුමාගේ අත්සනින් යුතුව මෙම සිදුවීමේදී ශාලාධිපති ලෙස අවස්ථානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අගයමින් සහ ශාලාධිපති ලෙස මුහුණදීමට සිදුවූ ගැටලුව හේතුවෙන් රාජකාරී ඉටු කිරීමේදී යම් අපහසුතාවයකට පත් වූයේ නම් කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා ලිපියක් යොමුකර තිබීමෙන් හා 2025 වසරේ පැවති අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ ශාලාධිපති ලෙස රාජකාරී කටයුතුවල යෙදවීමෙන් ද මෙම වගඋත්තරකරු මෙම සිදුවීමේදී කටයුතු කළ ආකාරය නිවැරදි බව පෙනීයයි. මන්දයත් ඊට සාපේක්ෂව තෙවන හා සිව්වන වගඋත්තරකරුවන් ලෙස නම්කර ඇති ශාලාධිපතිවරුන් දෙදෙනාගේ හා දෙවන වගඋත්තරකරු වන අධීක්ෂකවරියගේ විභාග කටයුතු එනම් ශාලාධිපති / අධීක්ෂණ කටයුතු තහනම් කිරීම මගින් ද එය තවදුරටත් තහවුරු වේ.
- මෙම සිසුවා 2024.05.09 වන දින ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයේ දෙවන කොටස සඳහා පිළිතුරු ලියමින් සිටින අවස්ථාවේදී විභාග ශාලා අධීක්ෂණය සඳහා පැමිණි දෙවන වගඋත්තරකරු වන කැළණිය අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) ඩී.ඩී.එස්. ලියනගේ මිය විසින් කටයුතු කර ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමේදී, විභාගයට මුහුණදෙමින් සිටින සිසුවෙකු සම්බන්ධයෙන් කටයුතු නොකළ යුතු ආකාරයේ හැසිරීමක් නිරීක්ෂණය වේ.
- එනම්, ඕෂධ මෙත්මල් රණතුංග දරුවා විශේෂ අවශ්‍යතා සහිත සිසුවෙකු බව දැන දැනම එවැනි දරුවන්ගේ මානසික මට්ටම පිළිබඳ මනා දැනුමක්, අවබෝධයකින් සහ සංවේදීභාවයකින් යුතුව කටයුතු කළ යුතුව තිබියදී, 2024.05.09 වන දින එම දරුවා විභාගයට මුහුණදෙමින් සිටි ක්‍රමවේදය එනම්, එක් නිරීක්ෂකයෙකු විසින් ප්‍රශ්න පත්‍රය කියවන විට තවත් නිරීක්ෂකයෙකු විසින් දරුවා ලබාදෙන පිළිතුරු රෙකෝඩරයක් මගින් පටිගත කර ගනිමින් සටහනක් කර ගැනීමේ ක්‍රියාවලිය, විභාග අවස්ථාවේදීම වෙනස් කිරීම කිසිසේතම උචිත නොවේ. ප්‍රශ්න පත්‍රයකට මුහුණදෙමින් සිටින සාමාන්‍ය විභාග අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් වුවද පිළිතුරු

ලියමින් සිටින අවස්ථාවේදී කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීම කිසිසේත් සුදුසු ක්‍රියාවක් ලෙස නොසැලකේ. සෑම දරුවෙක්ම විභාගයකට මුහුණදීමේදී සාමාන්‍ය තත්ත්වයට වඩා මානසික ආතතියකින් පසුවන බැවින්, විභාග අක්‍රමිකතාවයක් සිදුවන්නේ නම්, වගකිව යුතු නිලධාරීන් ලෙස සිසුවාට මානසික පීඩාවක් නොවන ආකාරයෙන් කටයුතු කිරීමට වගබලාගත යුතු අතර, ඒ පිළිබඳව පසුව වාර්තා කිරීම සහ අදාළ බලධාරීන් දැනුවත් කර සුදුසු පියවරක් ගැනීම උචිත වේ. එහෙත් මෙම සිදුවීමේදී, ශාලාධිපති හා සිසුවාගේ මව ප්‍රකාශ කර ඇති ආකාරයට, දෙවන වගඋත්තරකරුවන ඩී.ඩී.එස්. ලියනගේ මිය දරුවා පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ඇති බව පෙනීයයි. එ අනුව මෙම වගඋත්තරකරු විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගය මුහුණදෙන ආකාරය සම්බන්ධයෙන් සංවේදී නොවී උපදෙස් පත්‍රිකාව කෙරෙහි පමණක් අවධානය යොමුකරමින් තාක්ෂණික කරුණු මත පදනම්ව ක්‍රියාකර ඇති බව විමර්ශනයේදී අනාවරණය විය.

- තවද, දෙවන වගඋත්තරකරුවන ඩී.ඩී.එස්. ලියනගේ මිය වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ ශාලා අංක 01 මධ්‍යස්ථාන අංක 0412 හි පවත්වන ලද විභාග කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට පැමිණීමට පෙර එනම්, 2024.05.06, 07 සහ 08 යන දිනයන්හිදී විභාග අධීක්ෂණ කටයුතු සඳහා පැමිණි නිලධාරීන් විසින් මෙම දරුවා විශේෂ අවශ්‍යතා සහිත සිසුවෙකු බවට නිරීක්ෂණය කර, එම සිසුවා විභායට මුහුණදෙන ආකාරය නිවැරදි බවට, ශාලාධිපතිවරුන් වෙත ලබාදෙන ලද විභාග ජර්නලයේ ක්‍රමවත්ව විභාග කටයුතු පැවැත්වෙන බවට සටහන් යොදා ගොස් ඇති බවට නිරීක්ෂණය වේ. නිරීක්ෂකවරුන් තිදෙනෙකු විසින් විධිමත්ව සහ සංවේදීව මනා අවබෝධයකින් යුතුව මෙම දරුවා සම්බන්ධයෙන් කටයුතු කර ඇති බවත්, 2024.05.09 වන දින පැමිණි දෙවන වගඋත්තරකරු වන ඩී.ඩී.එස්. ලියනගේ මිය පමණක් උපදේශන පත්‍රිකාවේ දක්වන ලද තාක්ෂණික කරුණු මත ම පදනම්ව විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු සම්බන්ධයෙන් කිසිදු හැඟීමකින් තොරව කටයුතු කර ඇති බව වැඩිදුරටත් පෙනීයයි.
- සියලුම කරුණු විමර්ශනය කිරීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් 2023/2024 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය තුළ දෝෂ බොහෝමයක් පවතින බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් විභාග පැවැත්වීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලදී, එහි කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් හා එහිදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නියාමනයක් සිදුවී නොමැති බව පෙනීයයි. මේ හේතුවෙන් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා උපදෙස් පත්‍රිකා නිකුත් කිරීමේදී එම සිසුන් ඉල්ලීම් කරන ලද සහන නොලැබීම හේතුවෙන් විභාග අවස්ථාවේදී සිසුන් විශාල ලෙස අගතියට පත්ව ඇති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳ පූර්ණ වගකීම විභාග දෙපාර්තමේන්තුව සතුවන බව පෙනීයයි.
- 2023/2024 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග අවස්ථාවේදී තුන්වන වගඋත්තරකරු වන ඩී. පී. වෛද්‍යසේකර මහතා ක්‍රියාකාර ඇති ආකාරය විමර්ශනය කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය වේ.

එනම්, මෙම නිලධාරියා විසින් මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවා සම්බන්ධයෙන් වැඩිදුරටත් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද උපදෙස් පත්‍රිකාව ද සැලකිල්ලට ගනිමින්, මීට පෙර දරුවා රාජ්‍ය විභාග වලදී මුහුණදී ඇති ආකාරය පිළිබඳ අවධානය යොමුකරමින්, දරුවා කෙරෙහි මානුෂීය ආකාරයෙන් සහ මෙවැනි දරුවන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මනා සංවේදීතාවයකින් යුතුව ක්‍රියාකාර ඇති බව පෙනීයයි. එය තවදුරටත් 2025.02.24 දින විභාග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය විභාග කොමසාරිස් (විමර්ශන) තුමාගේ අත්සනින් යුතුව මෙම සිදුවීමේදී ශාලාධිපති ලෙස අවස්ථානුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් අගයමින් සහ ශාලාධිපති ලෙස මුහුණදීමට සිදුවූ ගැටලුව හේතුවෙන් රාජකාරී ඉටු කිරීමේදී යම් අපහසුතාවයකට පත් වූයේ නම් කණගාටුව ප්‍රකාශ කරමින් නිකුත් කරන ලද ලිපිය මගින් තහවුරු වේ. ඒ අනුව මෙම පැමිණිල්ලේ විෂය ගත සිදුවීම සම්බන්ධයෙන් තුන්වන වගඋත්තරකරු වශයෙන් නම් කර ඇති ඩී. පී. වෛද්‍යසේකර මහතා වගකීමට යටත් නොවන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ.

**නිගමනය :**

දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද සියලුම කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරුව, පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවයන් වන විශේෂ අවශ්‍යතා සහිත ඔෂධ මෙත්මල් රණතුංග සිසුවා සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ සිට, උපදෙස් පත්‍රිකා නිකුත් කිරීම තෙක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකිවයුතු බව ද, වත්තල ශාන්ත අන්තෝනි ජාතික පාසලේ ශාලා අංක 01 මධ්‍යස්ථාන අංක 0412 හි 2024.05.09 වන දින විභාග අධීක්ෂක ලෙස කටයුතු කළ කැළණිය අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) ඩී.ඩී.එස්. ලියනගේ මිය පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් වන බවට සංවේදීභාවයකින් සහ අවස්ථානෝචිතව කටයුතු නොකිරීම හේතුවෙන් උද්ගත වූ ගැටලුකාරී තත්ත්වයට වගකිවයුතු බව ද මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරමු.

එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ චක්‍රලේඛ, විධිවිධාන, මාර්ගෝපදේශ නිකුත්කර තිබිය දී, විභාගයකට මුහුණදීමට යන මෙම විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයා මානසික පීඩනයට පත්වන ආකාරයෙන් කටයුතු කර ඇති බව ද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. ඒ අනුව **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ද, විභාග අධීක්ෂක ලෙස කැළණිය අධ්‍යාපන කලාපයේ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) ඩී.ඩී.එස්. ලියනගේ මිය විසින් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.**

එමෙන්ම 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. තවද, 1996 අංක 28 දරණ "ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත" මගින් සහ 2016 පෙබරවාරි මස 08 වන දින "ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට" (United Nations Convention on the Rights of Persons with Disabilities) ශ්‍රී ලංකාව අත්සන් තබමින් විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ නෛතික රාමුව තුළ බැඳී සිටී.

ඉහත දක්වන ලද ආකාරයේ නීති රාමුවකින් බැඳී සිටින අවස්ථාවකදී, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යන නීති උල්ලංඝනය වන ආකාරයෙන් උක්ත වගඋත්තරකරුවන් විසින් කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත පරිදි නිර්දේශ කර සිටී.

නිර්දේශ :

ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) සහ විභාග කොමසාරිස් ජනරාල් විසින්,

1. ඔෂධ මෙත්මල් රණතුංග සිසුවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම දරුවා මීට පෙර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු පාසලේ වාර විභාග සඳහා මුහුණදුන් ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමුනොකර නිවැරදි තක්සේරුවක් සිදුනොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණදීමේදී මෙම සිසුවාට ලබාදිය යුතු සහන සහිත උපදෙස් පත්‍රිකාවක් නිකුත් නොකිරීම හේතුවෙන් අගතියටපත්ව ඇත. එබැවින් මෙම සිසුවාගේ සම්මුඛ පරීක්ෂණය සිදුකළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් විමර්ශනය කර එම නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියමාර්ගයක් ගත යුතු අතර, එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2. ඔෂධ මෙත්මල් රණතුංග සිසුවා විභාගයට මුහුණදෙමින් සිටියදී විභාග අධීක්ෂණ කටයුතු සඳහා පැමිණ විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු සම්බන්ධයෙන් සංවේදීව සහ අවස්ථානෝචිතව කටයුතු කළ යුතුව තිබියදී, ඒ පිළිබඳව සැලකිල්ලක් නොදක්වමින් උපදෙස් පත්‍රිකාව මත පමණක් පදනම්ව කටයුතු කරමින් ක්‍රියාකිරීම සම්බන්ධයෙන් දෙවන වගඋත්තරකරු වන ඩී.ඩී.එස්. ලියනගේ මිය

සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, මෙම නිලධාරිනිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මෙවන විටත් පනවා ඇති විභාග අධීක්ෂණ කටයුතු තහනම ඉදිරියට ද සුදුසු ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය. මෙම වගඋත්තරකරු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතුය.

2026. ..[illegible]...[illegible]4..... වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා - කා.දැ.ගැ.ද
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම් - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,බත්තරමුල්ල.